// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2463/09 – 2025 නොවැම්බර් මස 18 වැනි අඟහරුවාදා – 2025.11.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/V/2015/92.

**කාර්මික ආරාවුල් පනත – 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2017.12.26 දිනැති හා අංක 2051/9 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2017.12.19 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් දික්වැල්ල, නිල්වැල්ල, ඉහුරුතුඩුව හි පදිංචි බී. ඒ. වීරසිංහ මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 50/2017 හා 2025.09.04 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 ඔක්තෝබර් මස 30 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාව

බී. ඒ. වීරසිංහ මයා
ඉහුරුතුඩුව,
නිල්වැල්ල,
දික්වැල්ල.

A/50/2017
IR/COM/02/V/2015/92

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
අංක 200,
කිරුළ පාර,
කොළඹ 05.

*අතර ඇති වී ඇති කාර්මික ආරාවුල*

කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය වේලාතන්ත්‍රිගේ දොන් ජෝන් සෙනවිරත්න මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල අනුව, එකී කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා 2017.12.19 දාතමින් බේරුම්කරු වශයෙන් මා පත් කරන ලදී.

කම්කරු කොමසාරිස් ජනරාල් 2017.11.11 දින හා IR/COM/02/V/2015/92 දරන ලේඛනය අනුව මෙම ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ තංගල්ල ඩිපෝවේ ආරක්ෂක නියාමක ලෙස සේවය කළ බී. ඒ. වීරසිංහ මහතාට/ ශ්‍රී ලංගම/ මාසක/ විනය/11/2014 හා 2014.04.22 දිනැති විනය නියෝගය මගින් ලබා දී ඇති දඬුවම මගින් යම් අසාධාරණයක් සිදු වී තිබේද යන්න හා එසේ නම් ඔහුට හිමි විය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.

ඉල්ලුම්කරු 2018.01.19 දාතමින් ඉදිරිපත් කර ඇති ලිපියේ සඳහන් කර ඇත්තේ ඉල්ලුම්කරු තංගල්ල ඩිපෝවේ සේවය කරමින් සිටියදී 2013.05.01 දින සිට තමාගේ සේවය තහනම් කරන ලද බවත් අනතුරුව තමා වෙත චෝදනා පත්‍රයක් ඉදිරිපත් කර විනය පරීක්ෂණයක් පැවැත්වූ බවත් එම විනය පරීක්ෂණයේ නියෝගය අනුව 2014.05.20 වැනි දින සිට සේවය තහනම් කර සිටි කාලය දඬුවමකට යටත් කර මාතර ඩිපෝවට ස්ථාන මාරුවක් ලබාදුන් බවය. ඒ සම්බන්ධයෙන් තමා ඉදිරිපත් කළ අභියාචනයද ප්‍රතික්ෂේප වූ බව ඉල්ලුම්කරු සැලකර ඇත.

තමා සම්බන්ධයෙන් 2 වන පාර්ශ්වය අනුගමනය කළ ක්‍රියා කලාපය අයුක්ති සහගත හා අනිත්‍යානුකූල බව සඳහන් කරමින් සේවය අත්හිටුවීම නිසා අහිමි වූ වැටුප අයුක්ති සහගත ලෙස සේවය අත්හිටුවීම හේතුවෙන් සුදුසු වන්දි මුදලක් හා අනෙකුත් ව්‍යවස්ථාපිත අයිතිවාසිකම් ලබා දෙන ලෙස ඉල්ලා ඇත.

2 වන පාර්ශ්වය 2018.02.15 දින සිය මුල් ප්‍රකාශය මගින් කරුණු දක්වමින් සඳහන් කර ඇත්තේ ඉල්ලුම්කරු තංගල්ල ඩිපෝවේ සේවය කරමින් සිටියදී ඩිපෝ කළමනාකාරිත්වය හැල්ලුවට ලක් කරමින් අසත්‍ය ලේඛන සටහන් තැබීමෙන් තම තරාතිරම ඉක්මවා කටයුතු කිරීමෙන් බරපතල විෂමාචාර ක්‍රියාවන් සිදුකිරීම නිසා 2013.04.26 දිනැති ලිපිය මගින් 2013.05.01 දින සිට වේතන රහිතව සේවය තහනම් කරන ලද බවයි. අනතුරුව චෝදනා පත්‍රයක් ලබාදී විනය විභාගයක් පවත්වන ලද බවත් එම විනය විභාගයෙන් වරදකරු වීමෙන් පසු සේවා තහනම් කාලය දඬුවමකට යටත්කර සේවයේ පිහිටුවීම හා වහාම බලපවත්වන පරිදි මාතර ඩිපෝවට මාරුකර යවන ලද බවත් ඉල්ලුම්කරු විනය නියෝගයට එරෙහිව අභියාචනා නොකරන ලද බවත්ය. 2 වන පාර්ශ්වය ඉල්ලා සිට ඇත්තේ ඉල්ලුම්කරුගේ ඉල්ලීම නිෂ්ප්‍රභා කරන ලෙසය.

ඉල්ලුම්කරු 2018. 03.13 වන දින පිළිතුරු ප්‍රකාශයක් ඉදිරිපත් කරමින් 2 වන පාර්ශ්වය තමා වෙත චෝදනා පත්‍රයක් ලබාදුන් බව පිළිගන්නා ලද අතර එහි සඳහන් චෝදනා ව්‍යවස්ථා විරෝධී හා සාධාරණ හා යුක්ති සහගත නොවන නිසා එම චෝදනා ප්‍රතික්ෂේප වන බවය. ඉල්ලුම්කරු තවදුරටත් තම පිළිතුරු ප්‍රකාශයෙන් සැලකර ඇත්තේ යම් විනය පරීක්ෂණයකදී ඉල්ලුම්කරුගේ නිර්දෝෂීභාවය මැනවින් පෙන්වා දී තිබියදී අසාධාරණ හා අයුක්ති සහගත ලෙස ඉල්ලුම්කරු නියෝජිත රැකවරණය කිසිදු සාධාරණ හේතුවක් නොදක්වා අවලංගු කොට එමගින් ඉල්ලුම්කරුට විනය පරීක්ෂණයකට ඉදිරිපත් වීමේ විනයානුකූල ඉඩකඩ වලක්වා ව්‍යවස්ථා විරෝධීව ද විනය පරීක්ෂණය ඒක පාර්ශ්විකව පවත්වා ව්‍යවස්ථා විරෝධී ලෙස දඬුවම් පැනවූ බවයි.

දෙපාර්ශ්වය අතර වූ ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීමට සුදුසු තත්වයක් නොපැවති නිසා 2018.11.07 වන දින විමසීමට ගන්නා ලදී. එදින ඉල්ලුම්කරු ද ඔහු වෙනුවෙන් නියෝජිත සුසිල් ගුණවීර මහතා දෙවන පාර්ශ්වය වෙනුවෙන් එම ආයතනයේ නීති නිලධාරී ශානිකා ගාල්ලගේ මහත්මිය රජයේ නීතිඥ හේෂානි කළුබෝවිල මහත්මීන් ද පෙනී සිටියහ. එදින ඉල්ලුම්කරු විසින් සිය මූලික සාක්ෂිය ලබා දෙමින් A1, A2, A3, A4, A5, A5a ලේඛන ලකුණු කර ඉදිරිපත් කරන ලදී. වැඩිදුරටත් මූලික සාක්ෂි 2019.01.11 දින ලබා දෙන අතර එදින A6, A6a, A7 ලකුණු කල අතර 2019.01.11 දින වැඩිපුර මූලික සාක්ෂි ලබා දෙමින් A8, A8a, A9, A9a, A9b, A10 ලේඛන වල 2019.09.27 දින A13, A14, A15 ද 2020.01.24 දින A13, A14, A15 ලේඛන ලකුණු කරන ලදී.

ඉල්ලුම්කරුගේ හරස් ප්‍රශ්න ඇසීම 2021.12.28 දින ආරම්භ කරන ලද අතර එහිදී R1, R1a, R2, R2a, R2b ඉල්ලුම්කරු සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත. ඩිපෝ කළමනාකරු විසින් තමාව කාර්යාලයට කැඳවා බැණ වැදුනු බවත් පසුව තමා සිටි ස්ථානයට ද පැමිණ බැණ වැදුණු බවයි. එසේ බැණ වැදුණේ තමාට රැකියාවට තර්ජනයක් වන ආකාරයට නිසා ඒ පිළිබඳව ලොග් පොතේ සටහනක් තැබූ බව සාක්ෂිකරු ප්‍රකාශ කළේය.

A 7 ලෙස ලකුණු කරන ලද ලොග් සටහන පාදක කරගෙන තමාගේ සේවය 2023.02.03 දින සිට තහනම් කළ බව සාක්ෂිකරු ප්‍රකාශ කළේය.

ඉල්ලුම්කරු සාක්ෂියේදී අදාළ ලොග් සටහන A 8 වශයෙන් ද ලකුණු කර එම ලොග් සටහන 2 වන ඡේදයේ 8A ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලදී.

8 ඡේදය බැන වැදීමක් පිළිබඳවද 8 ඒ 2 වන ඡේදය රාජකාරී කළ ස්ථානයට පැමිණ ඩිපෝ කළමනාකරු විසින් තර්ජනය කිරීම සම්බන්ධයෙන් ද එම ලොග් සටහනේ සඳහන් කල බව සාක්ෂිකරු සඳහන් කර ඇත. එහි ඉහළ නිලධාරීන්ගේ දැන ගැනීම සඳහා යනුවෙන් සටහන් කර ඇති බවය. සාක්ෂිකරු වැඩිදුරටත් සාක්ෂි දෙමින් ප්‍රකාශකරු පළමු අවස්ථාවේ බැන වැදීම සිදුකළ බව ලොග් සටහනක් නොතැබුවේ ඩිපෝ කළමනාකරුට ගරු කිරීමක් වශයෙන් බවයි. නැවතත් තමාට තර්ජනාත්මක අයුරින් බැන වැදුණු නිසා රැකියාවට හානියක් වේයයි සිතා ලොග් සටහන තැබූ බවයි.

වගඋත්තරකාරුගේ පාර්ශ්වයේ ස්ථාවරය වන්නේ අසත්‍ය ලොග් සටහනක් තබා අසත්‍ය චෝදනා ඉදිරිපත් කිරීම මගින් ඉල්ලුම්කරු විෂමාචාර ක්‍රියාවක් සිදුකර ඇති බවයි. ආයතනයේ කටයුතු නිසි ලෙස පවත්වාගෙන යාම ආයතනයේ වගකීම බවත් ඉල්ලුම්කරු නොසැලකිලිමත් ලෙස කටයුතු කළ බැවින් රාජකාරිය නිසි ලෙස ඉටු කරන ලෙසට අවවාද කළ බවත්ය. දෙපාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද කරුණු සලකා බැලීමේදී පැහැදිලි වන්නේ විෂමචාර ක්‍රියාමාර්ග ගතහැකි බවට සේවා යෝජක ආයතනයට අයිතියක් ඇති බවයි.

ඒ අනුව ඉල්ලුම්කරුට දී ඇති ස්ථාන මාරුව මගින් ඉල්ලුම්කරුගේ අයිතිය කඩවීමක් හෝ සේවා ගිවිසුම කඩවීමක් සිදු වී නැති බව තීරණය කරමි. ඒ අනුව ඉල්ලුම්කරුගේ ඉල්ලීම ගාස්තු රහිතව නිෂ්ප්‍රභා කරමි.

මෙම තීරණය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයන් බව සහතික කරමි.

**නීතිඥ සරත් ලියනගේ,**
බේරුම්කරු.

2025 සැප්තැම්බර් මස 04 වැනි දින.

EOG 11 - 0129

මගේ අංකය: IR/COM/02/2020/54.

**කාර්මික ආරාවුල් පනත – 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2025.08.05 දිනැති හා අංක 2448/21 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2025.07.31 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කුරුවිට, බටතොට, උස්සද්දෙනිය, නො. 115/ජී/5 හි පදිංචි එච්. ජී. රත්නායක මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 05, නාරාහේන්පිට, කිරුළ පාර හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 60/2025 හා 2025.09.11 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 ඔක්තෝබර් මස 30 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාව**

ගොනු අංකය IR/COM/02/2020/54
නඩු අංකය - A/60/2025

එච්. ජී. රත්නායක මයා
නො. 115/ ජී/5,
උස්සද්දෙනිය,
බටතොට,
කුරුවිට.

පළමු පාර්ශ්වය

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
කිරුළ පාර,
නාරාහේන්පිට,
කොළඹ 05.

*දෙවන පාර්ශ්වය*

පළමු පාර්ශ්වය වෙනුවෙන් කිසිම නියෝජිතයකු හෝ ඉල්ලුම්කරු ද පෙනී නොසිටින ලදී. දෙවන පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ නදීෂා අමරතුංග මහත්මිය පෙනී සිටින ලදී.

**ප්‍රදානය**

කම්කරු, අමාත්‍ය අචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා 2025.07.31 බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

**ආරාවුලට හේතු වී ඇති කරුණ**

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් රත්නපුර ඩිපෝවේ සේවය කරමින් සිටි එච්. ජී. රත්නායක මයා 2015.09.29 දින සිට සේවයෙන් පහ කිරීම මගින් ඔහුට අසාධාරණයක් සිදුවී තිබේද? එසේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද යන්නත් පිළිබඳ වේ.

**පෙනී සිටීම සහ බේරුම්කරන විභාග පටිපාටිය**

01. මෙම පරීක්ෂණය පළමුවරට කැඳවූ දින 2025.09.04 දෙපාර්ශ්වයම පැමිණ සිටින ලදී. නමුත් 2025.08.12 දිනැති ලිපියෙන් දන්වා තිබූ ලේඛන පිටපත් 03 ක් රැගෙන එන ලෙස දන්වා තිබූ නමුත් දෙපාර්ශ්වයම එම ලේඛන රැගෙනවිත් නොමැති නිසා දෙපාර්ශ්වයටම 2025.09.11 වැනි දින එම ලේඛන සමග ඉදිරිපත්වන ලෙස දන්වන ලදී.

02. පළමු පාර්ශ්වය 2025.09.11 වැනි දින කිසිම දැන්වීමකින් තොරව පරීක්ෂණය සඳහා පැමිණ නොසිටින ලදී.

03. ඉල්ලුම්කරුට කිහිපවිටක්ම දුරකථනයෙන් ආයතනයේ නිලධාරිනියක් ඇමතීමක් කරන ලදී. කෙසේ නමුත් එම දුරකථනවලට කිසිම ප්‍රතිචාරයක් පළමු පාර්ශ්වය දක් නොවන ලදී.

04. දෙවන පාර්ශ්වය දන්වන ලද ලේඛන අද දින පරීක්ෂණයට ඉදිරිපත් කරන ලදී. එහි පළවෙනි පාර්ශ්වකරු විසින් ඔහුට හිමි සියලුම වැටුප් හා පාරිතෝෂික මුදල් ද ලබාගෙන ඇති බව ඉදිරිපත් කරන ලේඛනවලින් පෙන්නුම් කරන ලදී.

**ප්‍රදානය**

01. ඉහත සඳහන් කරුණු සැලකිල්ලට ගෙන පළවෙනි පාර්ශ්වය මෙම පරීක්ෂණයට උනන්දුවක් නොදක්වන බව පෙනී යයි.

02. එසේ මෙම ඉල්ලීම ඉහත සඳහන් කරුණු සැලකිල්ලට ගෙන නිෂ්ප්‍රභා කරමි.

03. තවද එක් පාර්ශ්වයකින් තවත් පාර්ශ්වයකට කිසිම මුදලක් මේ සම්බන්ධයෙන් අයකර ගැනීමට බැරි බවට නියෝග කරමි.

මෙය සාධාරණ, යුක්ති සහගත ප්‍රදානයක් බවට ප්‍රකාශ කරමි.

**කපිතාන් එම්. ජී. ජී. මෙන්ඩිස්,**
බේරුම්කරු.

2025 සැප්තැම්බර් මස 11 වැනි දින,
කාර්මික අධිකරණයේ දී ය.

EOG 11 - 0130

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.